Lesson 19 **අතීතයේ සිදුවෙමින් පැවති ක්‍රියා**

තවත් උදාහරණ

අපි පසුගිය පාඩමේදි ඉගෙන ගත්තෙ අතීත කාලයේ කරමින් සිටි ක්‍රියා පිලිබදව. අතීත කාලයේ කරමින් සිටි ක්‍රියා ප්‍රකාශ කිරීමේදී වාක්‍ය සෑදෙන ව්‍යාකරනමය රටාව අපි දැන් දන්නවා. එම කාලය ප්‍රායෝගික භාවිතාවේ යෙදෙන අවස්ථා සඳහා තවත් උදාහරන මේ පාඩමේ අඩංගු වෙනවා. මෙයට කියන්නේ Past Continuous Tense කියලා. මේ tense එක ප්‍රායෝගික ඉංග්‍රිසි කතාවේ ඉතාම සුලබව යෙදෙන tense එකක්. එය යෙදිය යුතු තැන නිවැරදිව යෙදීමෙන් ඔබේ ඉංග්‍රිසි කතාවට අමුතු ආලෝකයක් ලැබෙනවා නිසැකයි. මෙහිදිත් වෙනත් කාලයන්ට අයත් වාක්‍ය රටා මෙම කාලයත් සමග යෙදී තිබෙනවා( වරහන් තුල සදහන් වෙන්නෙ ඒවා) මන්ද අතීත කාලයේ මෙම tense සමග අනෙකුත් අතීත කාල tenses සහ වෙනත් රටාවන් බොහෝ විට යෙදෙන නිසා. මෙහිදීත් මේ වාක්‍ය වල ඍජු සිංහල පරිවර්තය නෙවෙයි තේරුම විදියට දී තිබෙන්නේ. ඒ වාක්‍ය සාමාන්‍ය සිංහල ව්‍යවහාරයේ බොහෝවිට කියවෙන්න ඉඩ තිබෙන විදිය. එය ඔබට වඩාත් උපකාරී වෙයි කියල අප විශ්වාස කරනවා ඔබට අවශ්‍ය විට ඔබ සිංහලෙන් හිතන දේ ඉතාම ඉක්මනින් ඉංග්‍රීසියෙන් ප්‍රකාශ කිරීමට. ඒ නිසා මේ වාක්‍ය හොදින් අධ්‍යනය කර ඒවා ඔබේ එදිනෙදා භාවිතයේදි යොදාගන්න

More Examples:-

I was staying in Nawala that time
අයි වෝස් ස්ටේයිං ඉන් නාවල දැට් ටයිම්
ඒ කාලේ මම නැවතිලා හිටියේ නාවල

What were you doing ? - I was reading
වට් ව(ර්) යූ ඩුයිං ? - අයි වෝස් රීඩිං
මොනවද ඔයා කර කර හිටියේ? - මම කියවමින් හිටියේ

(You didn’t answer any of my calls) Were you sleeping?
(යූ ඩිඩ්න්ට් ආන්ස්(ර්) එනි ඔෆ් මයි කෝල්ස්) ව(ර්) යූ ස්ලීපින්?
(ඔයා මගේ එකම කෝල් එකකටවත් ආන්ස්(ර්) කලේ නැහැ) ඔයා නිදාගෙනද හිටියේ?

No, I was listening to music. ( I didn’t hear the phone  ringing)
නෝ, අයි වෝස් ලිස්නිං ටු මියුසික්. (අයි ඩිඩින්ට් හියර්) ද ෆෝන්  රිංගින්)
නෑ, මම මියුසික් අහ අහ හිටියේ (මට ඇහුනෙ නෑ ෆෝන් එක රිං වෙනවා)
*( I didn’t hear the phone ringing වාක්‍ය තුල වෙනම ව්‍යාකරන රටාවක් තියෙනවා. ඒ පිලිබද වෙනම පාඩමක් මෙහි දෙවන කොටසේ අන්තර්ගතයි)

It was raining hard. (So I didn’t go out)
ඉට් වෝස් රේනිං හාඩ් (සෝ අයි ඩිඩින්ට් ගෝ අවුට්)
හයියෙන් වැස්සා (වසිමින් තිබුනා) (ඒ නිසා මම එලියට ගියේ නෑ)

(It’s not working now) But it was working very well before
(ඉට්ස් නොට් වර්)කිං නව්) බට් ඉට් වෝස් වර්)කිං වෙරි වෙල් බිෆෝ
(ඒක දැන් වැඩ කරන්නෙ නෑ) නමුත් කලින් ඒක හොඳට වැඩ කර කර තිබුණා

Hello! We were just talking about you
හලෝ ! වී වර්) ජස්ට් ටෝකින් අබවුට් යූ
හලෝ ! අපි මේ ඔයා ගැන කතා කර කර හිටියේ

What were you talking about me?
වට් වර්) යූ ටෝකිං අබවුට් මී?
මොනවද ඔයගොල්ලෝ මං ගැන කතා කර කර හිටියේ?

I was trying to find some solution
අයි වෝස් ට්‍රයිං ටු ෆයින්ඩ් සම් සොලියුෂන්
මම යම් විසඳුමක් හොයන්න උත්සහ කරමින් හිටියේ

We were waiting near the station ( but he didn’t come)
වී වර්) වේටිං නියර්) ද ස්ටේෂන් ( බට් හී ඩිඩින්ට් කම්)
අපි ස්ටේශම ලඟ බලන් හිටියා (නමුත් ඔහු ආවේ නැහැ)

The curry was boiling over ( So I turned off the oven)
ද කරි වෝස් බොයිලිං ඕවර්) ( සෝ අයි ටර්)න්ඩ් ඕෆ් ද අවන්)
හොද්ද උතුරලා ගියා (මම දකින විට එය වෙමින් තිබුණා) (ඒ නිසා මම ලිප ඕෆ් කලා)

She was cooking while I was helping her
ශී වෝස් කුකිං වයිල් අයි වොස් හෙල්පින් හර්)
ඇය ඉවුවා මම ඇයට උදව් කරන අතරතුර (while - අතරතුර)

What were you doing in my room?
වට් ව(ර්) යූ ඩුයිං ඉන් මයි රූම්?
ඔයා මොනවද මගේ කාමරේ කර කර හිටියේ?

What were you doing with my phone?
වට් ව(ර්) යූ ඩුයිං විත් මයි ෆෝන්?
මගේ ෆෝන් එකත් එක්ක ඔයා මොනවද කර කර හිටියේ?

It was giving a strange sound (before it stopped working)
ඉට් වෝස් ගිවිං අ ස්ට්‍රේන්ජ් සවුන්ඩ් බිෆෝ ඉට් ස්ටොප්ඩ් ව(ර්)කිං
ඒකෙන් අමුතු සද්දයක් ආවා නවතින්න කලින් (before - පෙර)

The roof was leaking everywhere
ද රූෆ් වොස් ලීකිං එව්රිවෙයා(ර්)
වහලෙ හැම තැනිම තෙමුණා (එසේ වෙමින් තිබුනා )

(It was rush hour and) the traffic was moving very slowly
ඉට් වෝස් රෂ් අව(ර්) ඇන්ඩ් ට්‍රැෆික් වෝස් මූවිං වෙරි ස්ලෝව්ලි
ඒ කඩිමුඩි වෙලාව. වාහන ගොඩාක් හෙමින් ගමන් කලේ

It was hanging by a thread
ඉට් වෝස් හැගිං බයි අ ත්‍රෙඩ්
ඒක නූලකින් එල්ලි එල්ලී තිබුනේ

I was going to call you( when you called me)
අයි වෝස් ගොයිං ටු කෝල් යූ වෙන් යූ කෝල්ඩ් මී
මම ඔයාට කෝල් කරන්න හැදුවෙ(කෝල් කරන්න ගියෙ) ඔයා මට කෝල් කරන කොට (when - විට )

(I couldn't sleep properly) because they were making so much noise
අයි කුඩින්ට් ස්ලීප් ප්‍රොප(ර්)ලි බිකෝස් දේ ව(ර්) මේකිං සෝ මච් නොයිස්
මට හරියට නිදා ගන්න බැරි වුනා ඔවුන් හරියට සද්ද කල නිසා (because - නිසා)

I was wondering what to do
අයි වෝස් වොන්ඩරිං වට් ටු ඩූ
මම කල්පනා කර කර හිටියේ මොකද කරන්නේ කියලා (මෙය හොද වාක්‍යයක්)

We were going to bed (when you came)
වී ව(ර්) ගොයිං ටු බෙඩ් වෙන් යු කේම්
අපි නිදාගන්න යන්න හැදුවේ ඔයා එනකොට

We were discussing about this problem yesterday
වී ව(ර්) ඩිස්කසිං අබවුට් දිස් ප්‍රොබ්ලම් යෙස්ට(ර්)ඩේ
අපි ඊයේ මේ ප්‍රශ්නේ ගැන කතා කර හිටියේ

We were watching tv (when someone rang the bell)
වී ව(ර්) වොචිං ටීවී වෙන් සම්වන් රෑං ද බෙල්
අපි ටීවී බල බල හිටියේ කව්ද බෙල්එක ගහන කොට

What were you doing at this time yesterday?
වට් ව(ර්) යූ ඩුයිං ඇට් දිස් ටයිම් යෙස්ට(ර්)ඩේ?
ඊයේ මේ වෙලාවට ඔයා මොකද කර කර හිටියේ?

I was going to buy it (but I changed my mind later)
අයි වෝස් ගොයිං ටු බයි ඉට් බට් අයි චේන්ජ්ඩ් මයි මයින්ඩ් ලේට(ර්)
මම ඒක මිලට ගන්න  ගියේ නමුත් මම පස්සෙ අදහස වෙනස් කලා

She was talking with someone (when I saw her this morning)
ෂී වොස් ටෝකිං විත් සම්වන් වෙන් අයි (වෙනයි) සෝ හ(ර්) දිස් මෝනිං
අද උදේ මම ඇයව දකිනකොට ඇය කාත් එක්කද කතා කර කර හිටියා

(I met her) when I was going to the bank
අයි මෙට් හ(ර්) වෙන් අයි (වෙනයි) වෝස් ගොයින් ටු ද බෑන්ක්
මම බැංකුවට යන කොට (යමින් සිටින අතර තුර) මට ඇයව හමු වුනා

(When I went there) he was talking with a girl
වෙන් අයි (වෙනයි) වෙන්ට් දෙයා(ර්) හී වෝස් ටෝකිං විත් අ ග(ර්)ල්
මම එහෙ යනකොට ඔහු ගෑනු ලමයෙක් එක්ක කතා කරකර හිටියා

He was getting late (so I left without him)
හී වෝස්  ගෙටිං ලේට් සෝ අයි ලෙෆ්ට් විතවුට් හිම්
ඔහු පරක්කු වුනා(වෙවී හිටියා) ඒ නිසා මම ඔහු නැතිව පිටත් වුනා

I wasn’t listening to the teacher.
අයි වොස්න්’ට් ලිස්නිං ටු ද ටීච(ර්)
මම ගුරුවරයාට ඇහුම්කන් දෙමින් නෙවෙයි හිටියේ

You weren’t listening to me ! That ‘s why this happened
යූ ව(ර්)න්ට් ලිස්ට්නින් ටු මී ! දැට්’ස් වයි දිස් හැපන්ඩ්
ඔයා මට ඇහුම්කන් දුන්නේ නෑ ! ඒකයි මේක සිද්ද වුනේ

He was always coughing
හී වෝස් ඕල්වේස් කොෆිං
ඔහු තිස්සේම කැහැ කැහැ හිටියේ (cough - කොෆ් - කහිනවා )

She was always shouting
ශී වෝස් ඕල්වේස් ෂවුට්ං
ඇය තිස්සේම කෑගහගහ හිටියේ

They were always fighting
දේ ව(ර්) ඕල්වේස් ෆයිට්ං
ඒගොල්ලො තිස්සෙම රන්ඩු කරකර හිටියෙ

I wasn’t attending classes this morning
අයි වොස්න්ට් අටෙන්ඩිං ක්ලාසස් දිස් මෝනිං
මම අද උදේ පන්ති වලට සහභාගී වෙමින් නෙවෙයි හිටියේ

We were enjoying the programme thoroughly. It was wonderful
වී ව(ර්) එන්ජෝයිං ද ප්‍රෝග්‍රෑම් තරලි . ඉට් වෝස් වන්ඩෆුල්
අපි හොදටම ප්‍රෝග්‍රෑම් එක එන්ජෝයි කළා , ඒක අපුරුයි ( thoroughly - තරලි - සම්පූර්නයෙන් / මුලුමනින්ම)

Things were getting better
තිංග්ස් ව(ර්) ගෙට්ං බෙට(ර්)
තත්වය හොද වී ගෙන ගියා (මෙහි things(දේවල්) කියන එකෙන් අදහස් වෙන්නෙ යමක් සම්බන්ද තත්වයන් කියන එක)

The situation was getting out of control . Someone needed to take some action
ද සිටුවේෂන් වෝස් ගෙට්ං අවුට් ඔෆ් කොන්ට්‍රෝල් . සමවන් නීඩඩ් ටු ටේක් සම් ඇක්ෂන්
තත්වය පාලනයෙන් ගිලිහෙමින් තිබුනේ. කව්රු හෝ යම් ක්‍රියා මාර්ගයක් ගැනීම අවශ්‍ය වුනා

I wasn't delaying the process but I wanted to make some corrections in it
අයි වොස්න්ට් ඩිලේයිං ද ප්‍රෝසෙස් බට් අයි වෝන්ටඩ් ටු මේක් සම් කරෙක්ෂන්ස් ඉන් ඉට්
මම ක්‍රියාවලිය පමා කළා නෙවෙයි , එහි වැරදි වගයක් නිවැරදි කරන්න මට අවශ්‍ය වුනා ( process - ක්‍රියාවලිය )

He wasn't driving fast
හී වොස්න්ට් ඩ්‍රයිවිං ෆාස්ට්
ඔහු වේගයෙන් එලවමින් නෙවෙයි හිටියේ

We weren't paying attention to the lesson
වී ව(ර්)න්ට් පේයිං අටෙන්ෂන් ටු ද ලෙසන්
අපි පාඩමට අවධානය යොමු කරමින් නෙවෙයි හිටියේ

She wasn't wearing a saree
ෂී වොස්න්ට් වෙයාරිං අ සාරි
ඇය සාරියක් ඇඳ ගෙන නෙවෙයි හිටියේ

They weren't getting ready for the event
දේ ව(ර්)න්ට් ගෙටිං රෙඩි ෆෝ දි ඉවෙන්ට්
ඔවුන් උත්සව අවස්ථාවට සූදානම් වෙමින් නෙවෙයි හිටියේ

We weren't looking at her
වී ව(ර්)න්ට් ලුකින් ඇට් හ(ර්)
අපි ඇය දිහා බලාගෙන නෙවෙයි හිටියේ

It wasn't raining at that time
ඉට් වොස්න්ට් රේනිං ඇට් ද ටයිම්
ඒ වෙලාවේ වසිමින් නෙවෙයි තිබුනේ

I wasn't sleeping
අයි වොස්න්'ට් ස්ලීපිං
මම නිදාගෙන නෙවෙයි හිටියේ

They weren't doing it properly
දේ ව(ර්)න්ට් ඩුයිං ඉට් ප්‍රොප(ර්)ලි
ඔවුන් ඒක හරියට කරමින් නෙවෙයි හිටියේ

She wasn’t working in the kitchen
ෂී වොස්න්ට් ව(ර්)කිං ඉන් ද කිචන්
ඇය කුස්සියේ වැඩ කරමින් නෙවෙයි හිටියේ

Water wasn’t coming out of the tap
වෝට(ර්) වෝස් නොට් කමින් අවුට් ඔෆ් ද ටැප්
ටැප් එකෙන් වතුර එමින් තිබුනේ නැහැ

We weren’t wearing seat belts .
වී ව(ර්)න්ට් වෙයාරිං සීට් බෙල්ට්ස්
අපි ආසන පටි පැළඳ ගෙන නෙවෙයි හිටියේ

They weren’t working quickly
දේ ව(ර්)න්ට් ව(ර්කිං ක්වික්ලි
ඔවුන් වේගයෙන් වැඩ කරමින් නෙවෙයි හිටියේ

They weren’t trying to fix it
දේ ව(ර්)න්ට් ට්‍රයිං ටු ෆික්ස් ඉට්
ඔවුන් ඒක පිළිසකර කරන්න උත්සාහ කරමින් නෙවෙයි හිටියේ

Were they getting late ?
ව(ර්) දේ ගෙටිං ලේට් ?
ඔවුන් ප්‍රමාද වෙමින්ද හිටියෙ ?

Were you waiting for the bus ?
ව(ර්)) යූ වේටිං ෆෝ ද බස් ?
ඔයා බස් එක එනකල් බලාගෙනද හිටියේ ?

Was he trying to cheat you ?
වෝස් හී ට්‍රයිං ටු චීට් යූ ?
ඔහු ඔයාව රවටන්නද උත්සාහ කරමින් හිටියේ ?

Was she cleaning the house all morning?
වෝස් ෂී ක්ලීනිං ද හවුස් ඕල් මෝනින් ?
ඇය උදේ වරුවෙම ගෙදර පිරිසිදු කර කරද හිටියේ ?

Were you studying for the exam last night?
ව(ර්) යූ ස්ටඩීං ෆෝ දි එග්සෑම් ලාස්ට් නයිට් ?
ඔයා ඊයේ රෑ විභාගෙට පාඩම් කර කරද හිටියේ ?

Were you driving to the office at that time?
ව(ර්) යූ ඩ්‍රයිවිං ටු ද ඔෆිස් ඇට් දැට් ටයිම් ?
ඔයා ඒ වෙලාවේ ඔෆිස් එකට වාහනේ එලවන ගමන්ද හිටියේ ?

Were they playing music all night?
ව(ර්) දේ ප්ලේයිං මියුසික් ඕල් නයිට් ?
ඔවුන් මුළු රෑ පුරාම සංගීතය වාදනය කරමින් හිටියද ?

Were you shopping in the town yesterday afternoon?
ව(ර්) යූ ශොපිං ඉන් ද ටවුන් යෙස්ට(ර්)ඩේ ආෆ්ටනූන් ?
ඊයේ හැන්දෑවේ ඔයා ටවුන් එකේ ෂොපින් කර කර හිටියද ?

Were they making a lot of noise ?
ව(ර්) දේ මේකිං අ ලොට් ඔෆ් (ලොටොෆ් ) නොයිස් ?
ඔවුන් ගොඩක් සද්ද කරමින්ද හිටියේ ?

Were you laughing at him?
ව(ර්) යූ ලාෆිං ඇට් හිම් ?
ඕගොල්ලෝ ඔහුට හිනාවෙමින්ද හිටියේ ?

Were they working in the garden in the evening?
ව(ර්) දේ ව(ර්)කිං ඉන් ද ගාඩ්න් ඉන් දි ඊව්නිං ?
ඔවුන් සවස ගෙවත්තේ වැඩ කර කරද හිටියේ ?

Were they running to catch the train?
ව(ර්) දේ රනිං ටු කැච් ද ට්‍රේන් ?
ඔවුන් කෝච්චිය අල්ලා ගන්න දුවන ගමන්ද හිටියේ ?

Were you talking to your friend on the phone?
ව(ර්) යූ ටෝකින් ටු යුව(ර්) ෆ්‍රෙන්ඩ් ඔන් ද ෆෝන් ?
ඔයා ෆෝන් එකෙන් යාලුවා එක්ක කතා කර කර හිටියද ?

Were they watching TV in the living room?
ව(ර්) දේ වොචිං ටීවී ඉන් ද ලිවින් රූම් ?
ඔවුන් සාලේ ටීවී බලමින්ද හිටියේ ?

Were they shouting at each other?
ව(ර්) දේ ෂවුටිං ඇට් ඊච් අද(ර්) ?
ඔවුන් එකිනෙකාට කෑ ගසමින්ද(කෝපයෙන් ) හිටියේ ?

Was she watering the plants in the garden?
වෝස් ෂී වෝටරිං ද ප්ලාන්ට්ස් ඉන් ද ගාඩ්න් ?
ඇය ගෙවත්තේ පැල වලට වතුර දමමින්ද හිටියේ ?

Were you using my phone?
ව(ර්) යූ යූසිං මයි ෆෝන් ?
ඔයා මගේ ෆෝන් එක පාවිච්චි කරකරද හිටියේ ?

Were they having dinner at that time?
ව(ර්) දේ හැවිං ඩින(ර්) ඇට් දැට් ටයිම් ?
ඔවුන් ඒ වෙලාවේ රාත්‍රී ආහාරය ගනිමින්ද හිටියේ ?

Wasn't he trying to help you ?
වොස්න්ට් හී ට්‍රයින් ටු හෙල්ප් යූ ?
ඔහු ඔයාට් උදව් කරන්න උත්සාහ කරමින් නෙවෙයිද හිටියේ ?

Weren't they repairing the leak ?
ව(ර්)න්ට් දේ රිපෙයාරින් ද ලීක් ?
ඔවුන් ලීක් එක අලුත්වැඩියා කරමින් නෙවෙයිද හිටියේ ?

මීලගට නිතර ඇසෙන , බෙහෙවින් ප්‍රයෝජනවත් විය හැකි වාක්‍යය කිහිපයක් ගමු .
ඔයා මොනවද කර කර හිටියේ ? එයත් මේ ව්‍යාකරණ රටාවටම සෑදෙන වාක්‍යයක් . නමුත් මොකක්ද (what ) කියන ප්‍රශ්න වචනේ එතනට එකතු වෙනවා

What were you doing ?
වට් ව(ර්) යූ ඩුයිං ?
ඔයා මොනවද කර කර හිටියේ ?

මේ තවත් එවැනි වාක්‍යය කිහිපයක්

Where were you going ?
වෙයා ව(ර්) යූ ගොයිං ?
ඔයා කොහේ යන ගමන්ද හිටියේ ?

Why were they laughing?
වයි ව(ර්) දෙයි ලාෆිං ?
ඇයි ඔවුන් හිනා වුනේ ?

What were you looking for?
වට් ව(ර්) යූ ලුකිං ෆෝ?
ඔයා මොනවද හොය හොය හිටියේ?

Why was she crying?
වයි වෝස් ෂී ක්‍රයිං ?
ඇයි ඇය අඬමින් හිටියේ?

Who were you waiting for?
හූ ව(ර්) යූ වේටිං ෆෝ?
කවුරු එනකල්ද ඔයා බලන් හිටියේ?

Lesson 19

## Spoken English

### Meeting Someone for the first time
### යමෙකුව ප්‍රථම වරට හමුවීම

යමෙකුව ප්‍රථමයෙන් මුනගැසෙන අවස්ථාව ඇතැම්විට වැදගත් අවස්ථාවක් වියහැකියි. මන්ද එම පුද්ගලයා ඔබේ ජීවිතයට ඉතාම වැදගත් පුදගලයෙකු බවට පත්වීමට ඉඩ ඇති බැවින්. එවැනි අවස්ථාවක ඔබ අනෙකාට සුහපතන ආකාරයෙන් ඔබ පිළිබඳ කදිම ප්‍රතිරූපයක් අනෙකා තුළ ජනිත වියහැකියි. ඒ නිසා කෙනෙකුව මුලින්ම හමුවූ අවස්ථාවක ඉතා ප්‍රියමනාප ලෙස කතාබහ කරන ආකාරය අපි ඉගෙන ගනිමු

මෙය යම් අයෙකුව යම් අවස්ථාවකදී තව කෙනෙකුට හදුන්වා දීමත් සමග ඒ දෙදෙනා අතර ඇතිවන සරල කතා බහක්

A : Saman, meet my good friend, Sandun.

සමන්, මීට් මයි ගුඩ් ෆ්‍රෙන්ඩ් සඳුන්.

සමන්" අඳුනගන්න මේ මගේ හොඳ යාළුවෙක්, සඳුන්

Sadun, this is Saman.

සඳුන්, දිසිස් සමන්
සඳුන්" මේ සමන්

B : Hello Sadun, nice to meet you!

හලෝ සඳුන්, නයිස් ටූ මීට් යූ.

හලෝ සඳුන්, ඔයාව මුනගැසීම සතුටක්

C : Hello, nice to meet you too!

හලෝ, නයිස් ටූ මී ට් යූ ටූ.

හලෝ, ඔයාව මුන ගැසීමත් සතුටක්

එම ප්‍රථම ආචාර සමාචාර කථාබහ මේ ආකාරයටත් වියහැකියි.

B : Hello , pleased to meet you

හලෝ, ප්ලීස්ඩ් ටු මීට් යු

හලෝ, බෙහෙවින් සතුටුයි ඔබව මුණගැසීම ගැන (pleased- ප්‍රසාදයට පත්)

C : Pleased to meet you too !

හලෝ ප්ලීස්ඩ් ටු මීට් යූ ටූ

ඔබව මුනගැසීම ගැනත් බෙහෙවින් සතුටුයි

තවත් විධියක් ...

B : Glad to meet you, Sandun!
ග්ලෑඩ් ටූ මීට් යූ සඳුන්.
ඔබව මුනගැසීම ගැන සතුටුයි සඳුන්

C : Glad to meet you too!
ග්ලෑඩ් ටූ මීට් යූ ටූ.
ඔබවත් මුනගැසීම ගැන සතුටුයි

හොඳයි මෙම කතාබහ තවත්දුරට ගලාගෙන යන ආකාරය බලමු

A : Saman, meet sandun. He is my assistant
සමන්, මීට් සඳුන්. හි ඉස් මයි ඇසිස්ටන්ට්
සමන්, මුන ගැහෙන්න සඳුන්ව. එයා මගේ සහායකයා

Sandun, this is Saman, my good friend
සඳුන්, දිස් ඉස් සමන්, මයි ගුඩ් ෆ්‍රෙන්ඩ්
සඳුන්, මේ සමන්, මගෙ හොඳ යාළුවෙක්

B : Hello, nice to meet you!
හලෝ, නයිස් ටු මීට් යූ !
හලෝ, හමුවීම සතුටක් !

C : Nice to meet you too !
නයිස් ටූ මීට් යූ ටූ!
ඔබවත් හමුවීම සතුටක් !

B Where are you from, Sandun ?
වෙයා ආ යූ ෆ්රොම්, සඳුන් ?
ඔයා කොහෙද සඳුන්?

C I am from Galle

අයෑම් ෆ්‍රොම් ගෝල්

මම ගාල්ලේ

B Really! Whereabouts in Galle?

රියලි! වෙයා(ර්)අබවුට්ස් ඉන් ගෝල්?

ඇත්තට! ගාල්ලේ කොහෙද?

C In Unawatuna

ඉන් උනවටුන

උනවටුනෙ

B I like that place a lot. We visit Unawatuna almost every year

අයි ලයික් දැට් ප්ලේස් අ ලොට්. වී විසිට් උනවටුන ඕල්මෝස්ට් එව්රි ඉය(ර්)

මම හරි කැමතියි ඒ තැනට. අපි හැම අවුරුද්දෙම වගේ උනවටුන බලන්න යනවා

C Oh really! Glad to hear that.

ඕ රියලි! ග්ලෑඩ් ටූ හියර්) දැට්

ආ ඇත්තද! අහන්න සතුටුයි ඒ ගැන

B By the way, what do you do?

බයි ද වේ, වට් ඩු යු ඩූ?

ඒක නෙමෙයි, ඔයා මොනවද කරන්නේ?

(by the way - බයි ද වේ - ඒක නෙවෙයි )

C I am a technician./ I work as a technician.

අයෑම් අ ටෙක්නීශන්/අයි ව(ර්)ක් ඈස් අ ටෙක්නීශන්.

මම තාක්‍ෂණ නිලධාරියෙක්/ මම තාක්‍ෂණ නිලධාරියෙක් විදියට වැඩකරනවා.

B Have we meet before?

හැව් වී මෙට් බිෆෝ?

අපි කලින් හමුවෙලා තියෙනවද?

C I don’t think so. I am sure this is the first time we are meeting.

අයි ඩෝන්ට් තිංක් සෝ. ඈම් ෂුව(ර්) දිස් ඉස් ද ෆස්ට් ටයිම් වී ආ මීටිං

මම එහෙම හිතන්නේ නෑ. මට විශ්වාසයි මේ පලවෙනි වතාව කියලා අපි මුණගැසෙන

B But you look very familiar to me

බට් යූ ලුක් වෙරි ෆමිලියා(ර්) ටූ මී

නමුත් මට ඔයාව හොඳට දැකලා පුරුදුයි. ( familiar - හුරුපුරුදු )

C Really!

රියලි!

ඇත්තට!

C Where are you from?

වෙයා(ර්) ආ යූ ෆ්‍රොම්?

ඔයා කොහේ ඉදලද? (ඔයාගේ ගම් පලාත කොහෙද?)

B I am from Gampaha

අයෑම් ෆ්‍රොම් ගම්පහ

මම ගම්පහ

What is your job ?

වට්ස් යුව(ර්) ජොබ් ?

ඔයාගේ රැකියාව මොකක්ද ?

- ඒ ප්‍රශ්නය වඩාත් ලස්සනට අහන්න පුළුවන් පහත ක්‍රම වලින්

What is your profession/Occupation?

වට්ස් යුව(ර්)ප්‍රොෆෙෂන්/ ඔකියුපේෂන් ?

ඔයාගේ වෘත්තීය මොකක්ද ?

What do you do for a living?

වට් ඩූ යූ ඩු ෆෝ අ ලිවිං?

මෙහි වචන වල අර්ථය ගතහොත් ජීවත්වීම සඳහා ඔබ කුමක් කරන්නේද? යන අර්ථය ලැබෙන්නේ. මෙය තවත් කෙටිකර ,

What do you do ?
වට් ඩූ යූ ඩූ ?
ඔයා මොනවද කරන්නේ ?

What line of work are you in ?
වට් ලයින් ඔෆ් ව(ර්)ක් ආ යූ ඉන් ?
මොන වගේ දෙයක්ද ඔයා කරන්නෙ ? (මෙය තවත් හොද විදියක් ඒ ප්‍රශ්නය අසන්න)

[කෙනෙකුගේ රැකියාව කුමක්ද කියා ඇසීමේදී What is your Job? (වට්ස් යුව(ර්) ජොබ්) ? යනුවෙන් අසන්නට පුළුවන්. නමුත් එය එතරම් ලස්සන නැහැ ]

ඔබේ රැකියාව මොකක්ද කියන ප්‍රශ්නයට මෙලෙස පිළිතුරු දියහැකියි

| | |
|---|---|
| I am a teacher. | I work as a teacher. |
| අයෑම් අ ටීච(ර්) | අයි ව(ර්)ක් ඈස් අ ටීච(ර්) |
| මම ගුරුවරයෙක්. | මම ගුරුවරයෙක් වශයෙන් වැඩකරනවා |

අපි බලමු ප්‍රථම වරට හමුවූ මේ දෙදෙනා වෙන් වී යනකොට සුභපතන්නේ කොහොමද කියලා.

B : Nice meeting you, Saman, Hope to see you soon again.
නයිස් මීටිං යූ සමන්. හෝප් ටූ සී යූ සූන් අගේන්.
ඔබව හමුවීම සතුටක් සමන්. යලිත් ඉක්මනින් ඔබව දකින්න බලාපොරොත්තු වෙනවා.

C : Nice meeting you too! see you soon!
නයිස් මීටිං යූ ටූ ! සී යූ සූන් !
ඔබව හමුවීමත් සතුටක්. ඉක්මනින් හමුවෙමු.

B : Keep in touch

කීප් ඉන් (කීපින් ) ටච්.

(මින් හඟවන්නේ සම්බන්ධතාවය පවත්වා ගන්න කියන එක.)

C : Sure! take care !

ෂුව(ර්) ! ටේක් කෙයා !

සහතිකවම ! පරිස්සමින් ඉන්න (take care යනුවෙන් හැඟවෙන්නේ ප්‍රවේශමෙන් කටයුතු කරන්න කියන එක. එය සමුගෙන යාමේදී නිතර භාවිතා වන බණ්ඩයක්)

B : Take care! Bye….

ටේක් කෙයා(ර්) ! බායි ...

C : Bye ….

භායි

අපි ඊළගට බලමු පළමු වරට හමුවන දෙදෙනෙකු තම තමන්ගේ තොරතුරු කතාබහ කරගන්නා ආකාරය.

බොහෝ විට දෙදෙනෙක් අඳුනාගත් විගස ඊළගට සිදුවන්නේ දෙදෙනාගේ තොරතුරු විමසීම. බටහිර රටවල නම් හඳුනා ගත් විගස අනෙකාගේ පුද්ගලික තොරතුරු විමසීම සීලාචාර දෙයක් ලෙස පිළිගන්නේ නෑ , නමුත් මෙහි එවැනි දෙයක් නොමැති නිසාත් , ඔබට යම් අවස්තාවක ඔබ පිළිබද යම්යම් තොරතුරු ඉදිරිපත් කිරීමට අවශ්‍ය විය හැකි නිසාත් මේවා දැන ගැනීම බෙහෙවින් ප්‍රයෝජනවත් වේවි . මෙය එවැනි සරල කතා බහක්. නමුත් මෙවැනි දෙබස් වලින් ඔබට ඉගෙන ගැනීමට ඇති දේ බොහෝමයි. ඔබගේ එදිනෙදා ඉංග්‍රීසි කතා බහ දියුණු කරගන්න, ඒ වගේම ඔබ පවසන දේ නිවැරදිව, නිරවුල්ව ඉදිරිපත් කිරීමට මෙවැනි කතාබහ තුලින් ඔබ ලබන දැනුම බොහෝ උපකාර වේවි

A: Where are you from ?

වෙයා(ර්) ආ යූ ෆ්‍රොම් ?

ඔයා කොහේ ඉඳලද? (ඔයා කොහෙද ?)

B: I am from Galle

අයෑම් ෆ්‍රොම් ගෝල්

මම ගාල්ලෙ

I am from here.
අයෑම් ෆ්‍රොම් හියර්(ර්)
මම මෙහේ

B:-Where are you from?
වෙයා(ර්) ආ යූ ෆ්‍රොම්?
ඔයා කොහෙද ?

A: I am originally from Tangalle but I live in Kandy now
අයෑම් ඔරිජිනලි ෆ්‍රොම් ටැන්ගෝල් බට් අයි ලිව් ඉන් කැන්ඩි නව්.
මගේ මුල් ගම තංගල්ල නමුත් මම දැන් ඉන්නේ නුවර (originally- මුලින්/ මුලදී)

A:-Do you have any brothers and sisters ?
ඩු යූ හෑව් එනි බ්‍රද(ර්)ස් ඇන්ඩ් සිස්ට(ර්)ස්?
ඔයාට සහෝදර සහෝදරියෝ ඉන්නවද?

How many members are there in your family?
හව් මෙනි මෙම්බ(ර්)ස් ආ දෙයා(ර්) ඉන් යුව(ර්) ෆැමිලි?
ඕගොල්ලන්ගේ පවුලේ සාමාජිකයෝ කී දෙනෙක් ඉන්නවද?

B: Yes,I have two brothers and one sister
යස් ,අයි හෑව් ටූ බ්‍රද(ර්)ස් ඇන්ඩ් වන් සිස්ට(ර්)
ඔව්,මට සහෝදරයෝ දෙන්නෙකුයි ,එක සහෝදරියෙකුයි ඉන්නවා

I have no brothers and sisters
අයි හෑව් නෝ බ්‍රද(ර්)ස් ඇන්ඩ් සිස්ට(ර්)ස්
මට සහෝදර සහෝදරියෝ නෑ

I am the only child in the family
අයෑම් ද ඕන්ලි චයිල්ඩ් ඉන් ද ෆැමිලි
මම පවුලේ එකම දරුවා

A: Areyou married?
ආ යූ මැරිඩ්?
ඔයා බැඳලද?

B: No ,I am not married yet
නෝ, අයෑම් නොට් මැරිඩ් යෙට්
නෑ,මම තාම බැඳලා නෑ

Yes I am married
ය(ර්)ස් අයෑම් මැරිඩ්
ඔව් මම බැඳලා

I hope to marry in this year
අයි හෝප් ටු මැරී ඉන් දිස් ඉය(ර් )
මම මේ අවුරුද්දේ බදින්න බලාපොරොත්තු වෙනවා

I am divorced
අයෑම් ඩිවෝස්ඩ්
මම දික්කසාදයි

A: What does your father do?
වට් ඩස් යුව(ර්) ෆාද(ර්) ඩු?
ඔයාගේ තාත්තා මොකද කරන්නේ?
(මේ ප්‍රශ්නය මෙහෙමත් අහනවා . " What is your father ? -වටිස් යුව(ර්) ෆාද(ර්) කියලා- එතකොට ඉන් අදහස් වෙන්නේ ඔයාගේ තාත්තා මොනවා කරන කෙනෙක් ද කියන එක. දැන් එය එතරම් භාවිතා වන්නේ නෑ )

B: My father is a businessman
මයි ෆාද(ර්) ඉස් අ බිස්නස්මන්
මගේ තාත්තා ව්‍යාපාරිකයෙක්

He is a businessman
හී ඉස් අ බිස්නස්මන්
ඔහු ව්‍යාපාරිකයෙක්

He is doing business
හී ඉස් ඩුයිං බිස්නස්
ඔහු බිස්නස් කරනවා

He is self employed
හී ඉස් සෙල්ෆ් එම්ප්ලොයිඩ්
ඔහු ස්වයං රැකියාවක නිරතයි.

B: Is it raining there these days?
ඉස් ඉට්(ඉසිට්) රේනිං දෙයා(ර්) දීස් ඩේස් ?
මේ දවස් වල එහේ වහිනවද?

How is the weather there nowadays?
හව් ඉස් ද වෙද(ර්)  දෙයා(ර්) නවුඅඩේස්  ?
මේ දවස් වල එහේ කාලගුණය කොහොමද?

A: No,it's not raining
නෝ ,ඉට්ස් නොට් රේනිං
නෑ, වහින්නේ නෑ

It's very hot there nowadays
ඉට් ඉස් වෙරි හොට් දෙයා(ර්) නවුඅඩේස්
එහේ හරි රස්නෙයි මේ දවස්වල

It's raining  a little
ඉට්ස් රේනිං අ ලිට්ල්
පොඩ්ඩක් වහිනවා

It's a bit cold there
ඉට්ස් අ බිට්  කෝල්ඩ් දෙයා(ර්
එහේ ටිකක් සීතලයි

B: By the way ,what do you do?
බයි ද වේ ,වට් ඩු යු ඩු ?
ඒක නෙමෙයි , ඔයා මොකද කරන්නේ ? (ඔයාගේ රස්සාව මොකක්ද?)

What line of work are you in ?
වට් ලයින් ඔෆ් ව(ර්ක් ආ යූ ඉන් ?
මොන වගේ දෙයක්ද ඔයා කරන්නෙ ?

Do you work ?
ඩූ යූ ව(ර්)ක් ?
ඔයා වැඩ කරනවද ? (මේ අහන්නෙ ඔයා රස්සාවක් කරනවද කියලා. මෙයත් ඉතාම හොද විදියක් කෙනෙකුගේ රැකියාව ගැන විමසන්න)

A: I work in a company
අයි ව(ර්)ක් ඉන් අ කම්පැනි
මම වැඩ කරනේ කම්පැනි

I am a clerk
අයි ඇම් අ ක්ලාක්
මම ක්ලාක් කෙනෙක්

I work as a clerk
අයි ව(ර්)ක් ඇස් අ ක්ලාක්
මම ක්ලාක් කෙනෙක් විදියට වැඩ කරනවා

What do you do ?
වට් ඩු යු ඩු ?
ඔයා මොකද කරන්නේ?

B: I don't work
අයි ඩෝන්ට් ව(ර්)ක්
මම වැඩ කරන්නේ නෑ

I am not doing a job
අයෑම් නොට් ඩුයිං අ ජොබ්
මම රැකියාවක් කරන්නේ නෑ

I am self employed
අයෑම් සෙල්ෆ් එම්ප්ලෝයිඩ්
මම ස්වයං රැකියාවක නියුතුයි

I work for my self
අයි වර්ක් ෆෝ මයි සෙල්ෆ්
මම මා වෙනුවෙන්ම වැඩ කරනවා (මෙය ඉතාම හොද විදියක් තමන් ස්වයං රැකියාවක නියුතු බව පවසන්න)

A: Are you still schooling?
ආ යූ ස්ටිල් ස්කූලින් ?
ඔයා තවම ඉස්කෝලේ යනවද?

B: No, I have finished my studies
නෝ, අයි හෑව් ෆිනිෂ්ඩ් මයි ස්ටඩීස්
නෑ, මම මගේ ඉගෙනීම ඉවර කරලා ඉන්නේ

Yes, I am doing my A/L s
යස්, අයි ඇම් ඩුයිං මයි ඒ ලෙවෙල්ස්
ඔව්, මම ඒ ලේවෙල් කරනවා

I am doing my degree in the university
අයෑම් ඩුයිං මයි ඩිග්‍රී ඉන් ද යුනිව(ර්)සිටි
මම විශ්ව විද්‍යාලේ උපාදිය කරනවා

A: Are you the eldest in the family?
ආ යූ දි එල්ඩස්ට් ඉන් ද ෆැමිලි ?
ඔයා පවුලේ වැඩිමලාද ?

B: No , I am not
නෝ , අයැම් නොට්
නෑ ,මම නෙමෙයි

Yes, I am the eldest
යස් , අයි ඇම් දි එල්ඩස්ට්
ඔව් ,මම තමයි වැඩිමලා

My sister is the eldest
මයි සිස්ට(ර්) ඉස් දි එල්ඩස්ට්
මගේ සහෝදරිය තමයි වැඩිමලා

A: Where in Kandy do you live?
වෙයා ඉන් කැන්ඩි ඩූ යූ ලිව්?
නුවර කොයි හරියේද ඔයා ඉන්නේ ?

B: In Peradeniya .It's very close to the town
ඉන් පේරාදෙණිය . ඉට්ස් වෙරි ක්ලෝස් ටු ද ටවුන්
පේරාදෙණියෙ , ටවුමට ගොඩක් කිට්ටුව

It's 5km away from the town
ඉට්ස් 5 කිලෝ මීට(ර්)ස් අවේ ෆ්‍රොම් ද ටවුන්
ටවුමේ ඉඳලා කි.මී 5 ක් එහා

It's a 10 minutes drive from the town
ඉට්'ස් අ ටෙන් මිනිට්ස් ඩ්‍රයිව් ෆ්‍රොම් ද ටවුන්
ටවුමේ ඉඳලා මිනිත්තු දහයයි යන්න තියෙන්නේ (වාහනයකින්)

A: How far is it from Colombo to your area ?
හව් ෆා ඉසිට් ෆ්‍රොම් කලම්බු ටු යුව(ර්) ඒරියා ?
කොළඹ ඉඳලා කොච්චර දුරද ඕගොල්ලන්ගේ පළාතට ?

Is it very far from Colombo to your area?
ඉස් ඉට් වෙරි ෆා ෆ්‍රොම් කලම්බු ටු යුව(ර්) ඒරියා?
කොළඹ ඉඳලා ගොඩක් දුරද ඕගොල්ලන්ගේ පළාතට ?

B: No, it’s not very far from Colombo
නෝ ,ඉට්ස් නොට් වෙරි ෆා ෆ්‍රොම් කලම්බු
නෑ,කොළඹ ඉඳන් වැඩිදුර නෑ
.
It’s about 120 km from Colombo
ඉට්ස් අබවුට් 120 කිලෝ මීට(ර්)ස් ෆ්‍රොම් කලම්බු
කොළඹ ඉදලා කි මී 120 ක් විතර ඇති

It’s not more than 120km from Colombo
ඉට්ස් නොට් මෝ දෑන් 120 කිලෝ මීටර්ස් ෆ්‍රොම් කලම්බු
කොළඹ ඉඳන් කිලෝ මීට(ර්)ස් 120 කට වඩා නෑ.

A: What do you do in your free time ?
වට් ඩූ යූ ඩූ ඉන් යුව(ර්) ෆ්‍රී ටයිම් ?
ඔයා විවේක වෙලාවට මොනවද කරන්නේ ? (මේ ප්‍රශ්නය මගින් බොහෝවිට
විමසන්නේ ඒ පුද්ගලයා විනෝදාංශ වශයෙන් කරන දේවල් )

B : I watch television
අයි වොච් ටෙලිවිෂන්
මම tv බලනවා

I listen to music
අයි ලිස්න් ටු මියුසික්
මම සංගීතය අහනවා

I read books
අයි රීඩ් බුක්ස්
මම පොත් කියවනවා

I play tennis
අයි ප්ලේ ටෙනිස්
මම ටෙනිස් සෙල්ලම් කරනවා

I go for walks
අයි ගෝ ෆෝ වෝක්ස්
මම ඇවිදින්න යනවා

A : Do you like music a lot ?
ඩූ යූ ලයික් මියුසික් අ ලොට් ?
ඔයා සංගීතෙට ගොඩක් කැමතිද ?

B : Yes , I like to listen to Hindi music. I like western music too
යස් , අයි ලයික් ටු ලිස්න් ටු හින්දි මියුසික් . අයි ලයික් වෙස්ටර්න් මියුසික් ටූ
ඔව් , මම හින්දි මියුසික් අහන්න කැමතියි . මම බටහිර සංගිතෙටත් කැමතියි

A: What is your future ambition ?
වට් ඉස් යුව(ර්) ෆියුච(ර්) ඇම්බිෂන් ?
ඔයාගේ අනාගත බලාපොරොත්තුව මොකක්ද ?

මේ ප්‍රශ්නය තමයි මෙහෙ බොහෝවිට සුලභව ඇසෙන්නේ . නමුත් ඒ ප්‍රශ්නයම අහන තව හොද ක්‍රම තියෙනවා

What will you do in future ?
වට් විල් යූ ඩූ ඉන් ෆියුච(ර්) ?
අනාගතේ ඔයා මොනවා කරයිද ?

What do you want to do in the future?
වට් ඩූ යූ ඩූ ඉන් ද ෆියුච(ර්) ?
ඔයාට අනාගතයේදී මොනවද කරන්න අවශ්‍ය ?

What are your plans for the future?
වට් ආ යුව(ර්) ප්ලෑන්ස් ෆෝ ද ෆියුච(ර්) ?
ඔයාගේ අනාගත සැලසුම් මොනවද ?

What career are you aiming for?
වට් කරිය(ර්) ආ යූ ඒමින් ෆෝ ?
මොන වෘත්තියද ඔයා ඉලක්ක කරන්නේ ? ( aim - ඉලක්ක කරනවා ) (career - වෘත්තීය )

ඒ ප්‍රශ්නයට මෙලෙස පිළිතුරු දෙන්න පුළුවන්

B:- I want to be an engineer
අයි වොන්ට් ටු බී ඇන් ඉංජිනිය(ර්)
මට ඕනා ඉංජිනේරුවෙක් වෙන්න

I want to become an engineer
අයි වොන්ට් ටු බිකම් ඇන් ඉංජිනිය(ර්)
මට ඕනා ඉංජිනේරුවෙක් වෙන්න (become - (බවට ) පත් වෙනවා)

I would like to be a marketer
අයි වුඩ් ලයික් ටු බී අ මාකට(ර්)
මම කැමතියි අලෙවිකරුවෙක් වෙන්න

I would like to work in tourism industry
අයි වුඩ් ලයික් ටු ව(ර්)ක් ඉන් ටුවරිස්ම් ඉන්ඩස්ට්‍රි
මම කැමතියි සංචාරක කර්මාන්තයේ වැඩ කරන්න

I am really interested in web designing. I will do something related to it
අයැම් රියලි ඉන්ටරෙස්ටඩ් ඉන් වෙබ් ඩිසයිනින් . අයි විල් ඩූ සම්තින් රිලේටඩ් ටු ඉට්
මම ඇත්තටම උනන්දුයි වෙබ් ඩිසයිනින් වලට . මම ඊට සම්බන්ද දෙයක් කරාවි
(related - සම්බන්ද )

I will do something of my own. I am hoping to start a business
අයි විල් ඩූ සම්තින් ඔෆ් මයි ඕන් . අයැම් හෝපිං ටු ස්ටාට් අ බිස්නස්
මම මගේම දෙයක් කරවී . මම බිස්නස් එකක් පටන ගන්න බලාපොරොත්තු වෙනවා
(something of my own - මගෙම දෙයක් )

I haven’t decided yet. I have to consider the options after my studies
අයි හැවන්ට් ඩිසයිඩඩ් යෙට් . අයි හැව් ටු කන්සිඩ(ර්) ද ඔප්ශන්ස් ආෆ්ට(ර්) මයි ස්ටඩීස්
මම තාම තිරනය කරලා නැහැ . මගේ ඉගෙනීමේ වැඩ වලින් පස්සේ තියෙන අවස්ථා සලකා බලන්න වෙනවා (consider - සලකා බලනවා)

**Vocabulary 19**

Curry – කරි – ව්‍යංජනය, හොද්ද

Boil – බොයිල් – උණු කරනවා , රත් කරනවා

Boil over - බොයිල් ඕව(ර්) - උතුරලා යනවා

Rush hour – රෂ් අව(ර්) – කාර්යබහුල වේලාව

Hang – හැං – එල්ලනවා , එල්ලනවා

Wonder – වොන්ඩ(ර්) – පුදුම වෙනවා / පුදුමයෙන් හිතනවා

Discuss – ඩිස්කස් – සාකච්ඡා කරනවා

Discussion – ඩිස්කෂන් – සාකච්ඡාව

Thoroughly – තරලි – සම්පූර්ණයෙන්ම

Get better – ගෙට් බෙට(ර්) – සුව වෙනවා , හොඳ වෙනවා .හොඳ අතට හැරෙනවා

Control – කන්ට්‍රෝල් – පාලනය කරනවා

Out of control – අවුට් ඔෆ් කන්ට්‍රෝල් – පාලනයෙන් බැහැර

Delay – ඩිලේ – ප්‍රමාදය , ප්‍රමාද කරනවා

Correct – කරෙක්ට් – නිවැරදි, නිවැරදි කරනවා

Correction – කරෙක්ෂන් – නිවැරදි කිරීම

Attention – අටෙන්ෂන් – අවධානය

Seat belt – සීට් බෙල්ට් – ආසන පටි

Drive – ඩ්‍රයිව් – රිය පදවනවා

All night – ඕල් නයිට් – මුළු රෑ පුරා

Look for – ලුක් ෆෝ – සොයනවා

Glad – ග්ලෑඩ් – සතුටු

Assist – ඇසිස්ට් – උදව් කරනවා

Assistant – ඇසිස්ටන්ට් – සහායකයා

Whereabouts – වෙයාරබවුට්ස් – කොයි හරියේද ? කොහේ අවට පිටද ?

Technician – ටෙක්නීෂන් – තාක්ෂණවේදියා

Familiar – ෆමිලියර(ර්) – හුරුපුරුදු

Profession – ප්‍රොෆෙෂන් – වෘත්තිය

Occupation – ඔකියුපේෂන් – රැකියාව, වෘත්තිය

Originally – ඔරිජිනලි – මුලින්ම , මුල් වශයෙන්

Marry – මැරී  – විවාහ වෙනවා

Married – මැරීඩ් – විවාහ වූ

Get married – ගෙට් මැරීඩ් – විවාහ වෙනවා

Divorce – ඩිවෝස් – දික්කසාද කරනවා , දික්කසාදය

Divorced – ඩිවෝස්ඩ් – දික්කසාද වූ

Get divorced – ගෙට් ඩිවෝස්ඩ් – දික්කසාද වෙනවා

Businessman – බිස්නස්මන් – ව්‍යාපාරිකයා

Employed – ඉම්ප්ලෝයිඩ් – රැකියාවක් කරන

Unemployed - අන්එම්ප්ලෝයිඩ් - රැකියා විරහිත

Self employed – සෙල්ෆ් ඉම්ප්ලෝයිඩ් – ස්වයං රැකියාවක්  කරන

Employer - එම්ප්ලෝය(ර්) - හාම්පුතා

Employee - එම්ප්ලෝයී - සේවකයා

Weather – වෙද(ර්) – කාලගුණය

Climate – ක්ලයිමේට් – දේශගුණය

Clerk – ක්ලාක් – ලිපිකරු

Elder – එල්ඩ(ර්) – වැඩිමල්

Eldest – එල්ඩස්ට් – වැඩිමල්ම

Younger – යංග(ර්) – බාල

Youngest – යංගස්ට් – බාලම

Young - යං - තරුණ , බාල

Close – ක්ලෝස් – ආසන්න , ළඟ

Ambition – ඇම්බිෂන් – අභිලාෂය , බලාපොරොත්තුව

Engineer – එන්ජිනිය(ර්) – ඉංජිනේරුවා

Tourism – ටුවරිස්ම් – සංචාරක කර්මාන්තය

Related – රිලේටඩ් – සම්බන්ධ

Consider – කන්සිඩ(ර්) – සලකා බලනවා

Option – ඔප්ෂන් – විකල්පය

Career - කරිය(ර්) - වෘත්තිය